// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2157/4 - 2020 ජනවාරි මස 06 වැනි සඳුදා - 2020.01.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*යොමු අංකය:කේඑච්ටීඑස්/එල්එන්ඩී/03/ඒසීකිව්/*Other/08.
*ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ අංකය:එල්ඩී/05/2007/එෆ්ආර්/362.*

මහජන කටයුත්තක් සඳහා පහත දැක්වෙන ඉඩම අත්කර ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර:*

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කහවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අටකලන් කෝරළේ පන්නිල් පත්තුව සුළු කොට්ඨාසයේ, පන්නිල ග්‍රාම නිලධාරී වසමේ, පන්නිල ගමේ පිහිටි සර්වේ ජනරාල් විසින් පිළියෙල කරන ලද අ.ග.පි. අංක 701, අතිරේක අංක 30 හි, පත්‍ර අංක 30 සහ 2019.09.12 දිනැති මූලික පිඹුරේ කැබලි අංක 839 වශයෙන් පෙන්නුම් කරන මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 12.9373 ක් පමණ වන ඉඩම් කොටස.

01. කැබලි අංක 839
ඉඩමේ නම: ට්‍රින්කොවත්ත, පන්නිල්කන්ද මූකලාන;විස්තරය: වනාන්තර;හිමිකම් කියන අය: ඒ.ඒ. මානෙල් පෙරේරා, අංක 81, රොස්මීඩ් පෙදෙස, කොළඹ;ප්‍රමාණය: හෙක්ටයාර් 12.9373.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවළුන් හෝ 2020 පෙබරවාරි මස 12 වැනි දින පෙ.ව. 10.00 ට කහවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2020 පෙබරවාරි මස 05 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳත් විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

බී.ටී.ගයානි අයි. කරුණාරත්න,
ප්‍රාදේශීය ලේකම්,
කහවත්ත.

2019 දෙසැම්බර් මස 30 වැනි දින,
කහවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

01 - 530